# පන්හිඳයි පින්සලයි

# දිනේ ආනන්දේ !






සිසිර දිසානායක

"හැබෑට ම මේ ගෑරුප්පු, හැඳිත් එක්ක තියන්නෙ නැතිව වෙනම තියන්න තැනක්, විදියක් ඇත්තෙම නැද්ද ?" පන්හිඳ කුස්සිය පැත්තේ ඉඳන් උදේ පාන්දර මොර දුන්නා.

"හැඳි ගෑරුප්පු එක්ක එකට තියන්නැතුව මෝල්ගස් එක්ක තියන්නයැ ?" පින්සල නාන කාමරේ ඉඳන් ප්‍රශ්ණාර්තෙට තවත් ප්‍රශ්ණාර්තයක් ම තිව්වා.

"ඇයි මොකක්ද ප්‍රශ්ණෙ උදේපාන්දරම ?" පැන්සල කුස්සිය දිහාවට ආවා.

පන් කට්ටියට ම තේ හදන්න අරගෙන. තේ කොල තේ කෝප්ප පුරා පාවෙනවා. පන් තමුන්නෙ අතේ තිබුණ ගෑරුප්පුව ටැප් එකට ඇල්ලුවා. හැන්දක් කියලා පන් තේ දියකරන්න අරගෙන තියෙන්නෙ ගෑරුප්පුවක් ! තේ හදන්න දාපු තේ මළු හිල් වෙලා තේ කොල එළියට ඇවිත් !

"යස වැඩේ එක එක සිහියෙන් උඩ බලාගෙන වැඩ කරනවට. අඩුගානේ තේ හැන්දකයි ගෑරුප්පුවකයි තියෙන බරේ වෙනසවත් අතට දැනෙන්න එපායැ..." පැන් හිනා වුණා.

තුන්දෙනා එක්ක උදැහැනැක්කෙම අවදි වෙලා මේ ලක ලෑස්ති වුණේ වැදගත් පින් අතේ වැඩකට දායක වෙන්න යන්න. නමුත් ඉගෙන ගත්ත ඉස්කෝලේ ආදි කතෘතුමන්ලා සිහිකරලා දෙන දානය මේ වතාවේ සංවිධානය කරලා තිබුණේ ඩැංඩිනොං ධම්මදීප භාවනා මධ්‍යස්ථාන විහාරයේ. තුන්දෙනා ඒ කාලෙ එකට ඉස්කෝලෙ ගිය පන්ති මිත්‍රයො හන්දා තුන්දෙනාට ම උනන්දුව එක හැටියට ම තිබුණා.

"හැමෝම සුදෙන්ම ඇවිත් !" පන්සලට එකතුවෙලා හිටිය පිරිස දැකලා පන්ට හරි සතුටුයි.

"හරියට ඉස්කෝලෙ කාලෙ මතක් වුණා...." පින්ට කියවුණා ඉස්කෝලෙ නිල ඇඳුම තනි සුදු. ගොඩනැගිලි තනි සුදු. විහාරය වගේ ම බුදු පිළිම වහන්සේත් තනි සුදු.

"සුදු මල් අරගෙන පේළි හැදිලා විහාරෙට මල් පූජාවට ගිය හැටි මතක් වෙනවා..." පැන්ටත් ඒ අතීතෙ මතක් වුණා.

ඩැංඩිනොං ධම්මදීප භාවනා මධ්‍යස්ථානයේත්, ක්‍රිස්බරෝ ධම්ම සරණ විහාරස්ථානයේත්, බෙරික්වල ශාක්‍යමුණි විහාරයේත් ස්වාමීන් වහන්සේලාට දනට ආරාධනා කරලා තිබුණා. සර් හෙන්රි ස්ටීල් ඕල්කමා ඇතුලු ආදී කතෘතුමන්ලා හැමෝවමත් විදුහල්පතිවරුන-'ටත්, ගුරුවර ගුරුවරියන්ටත් පින් අනුමෝදන් කරලා පින්කම හොඳින් කෙරුණා. ගෙදර ආව පන්හිඳට තමුන්නෙ ඉස්කෝලේ කාලේ ගැන මතක් වුණා.

"මට මුලින්ම ආනන්දෙට ගිය දවස මතක් වෙනවා. පහේ ශිෂ්‍යත්ව විභාගෙ පාස් වෙලා අම්මයි තාත්තයි දෙන්නම එක්ක ඉස්කෝලෙට ඇතුලත් වෙන්න ගිය දවසේ එතකොට හිටපු ප්‍රින්සිපල් කර්නල් ජී. ඩබ්ලිව්. රාජපක්ෂ මහත්තයා හැම ළමයෙකුටම, කතා කරන්න අමතක කළේ නෑ. මාත් තාත්තයි අම්මයි එක්ක අපේ වාරේ ආවම එතුමාගේ කාර්යාලයට ඇතුල් වුණා.

"පුතා කාත් එක්කද අද ආවෙ ?" එතුමා මගෙන් ඇහුවා.

"අම්මත් එක්ක...." මට ඉබේටම කියවුණා.

"ඇයි තාත්තා....?" එතුමා හිනාවෙලා මගෙන් අහපු හැටි මට අදත් මතක් වෙනවා...." පන් අනික් දෙන්නාට තමුන්නේ මුල්ම දවසෙ කතාව කිව්වා. තමන් මුලින්ම කොළඹ ආනන්ද විද්‍යාලයට ගිය දවසේ මතක දේවල් කියන්න පින්සලත් හරි බරි ගැහුණා.

"මට මතක "හය - සී - දෙක" පන්තියේ කරුණාසේකර මැඩම් මුලින්ම අපට කියපු කතාවක්."

"ඒ මොකක්ද ඒ ? - මාත් උන්නේ ඒ පන්තියෙනෙ" ඒ පැන්සල.

"පුතාලා ගම් පළාත්වලින් තේරිලා හොඳට ඉගෙන ගන්න කොළඹ ආවා. ඉතින් මෙහෙදි හොඳට ඉගෙනගෙන ආයිමත් ඒ ගම් පළාත්වලටත් ගිහින් සේවය කරන්න ඕන. දෙමව්පියෝ වගේම ඒ පළාත් අමතක කරන්න හොඳ නෑ..."

"ඒකනෙ අකරවිට සංඝානන්ද ස්වාමීන් වහන්සේත් සිහිපත් කළේ. තමන්ට අත හිත දුන්න අයට වගේම ආයතනවලට කෘතවේදී වෙන එක උතුම්ය කියලා..." පැන් පින්කමේදී කරපු ස්වාමීන් වහන්සේගේ අනුශාසනාව මතක් කළා.

"ඇත්තට ම ඔය කියනකොටයි මතක් වෙන්නෙ." පන් තවත් මතකයකට මුල පිරුවා.

"මගේ තාත්තා නැති වුණේ අටේ පන්තියට පාස් වෙනකොටම වාගේ. අනේ මම දන්නෙත් නෑ කොහෙ-ාමද වුණේ කියලා. ඉස්කෝලේ ශිෂ්‍ය සංගම් කීපයක්ම ඉදිරිපත් වුණා මට දිගට ම උදව් කරන්න. පොත් පත්.... ඇඳුම් - පැළඳුම්... ඔය අතරේ බෞද්ධ සංගමය මුලටම උන්නා."

"ඒ වගේම පහසුකම් ගාස්තුවලින් මාව නිදහස් කරපු එකත් අම්මට ලොකු සහනයක් වුණා. ඒකනම් කරවන්න ඇත්තේ අටේ පන්තියේ පන්ති භාරව හිටපු කේ. එල් පෙරේරා ටීචර් කියලයි මං හිතන්නේ. මෙහේ අපිත් එක්ක ඉන්න රන්ජනි පහළවත්තගේ මව් තුමියනේ...."

"පන්ට විතරක් නෙවි, අපිටත් අඟ හිඟකම් තිබුණා..." ඒ පැන්. උසස් පෙළ පන්තිවල ළමයි දිග කලිසං ඇන්දත් මට ඒකට පුළුවන් කමක් තිබුණේ නෑ. මං සෑහෙන්න කාලයක් ඇන්දේ කොට කලිසං. ඒත් කවුරුවත් අපිව කොන් කළේවත්, විහිළු කළේවත් නෑ. අපි ගම්වලින් ආව කියලා කොන් කළේවත් නවක වදය දුන්නෙවත් නෑ. ඉස්කෝලෙට මුල ඉඳන් ආව අය අපිව පිළිගත්තේ, උදව් කළේ හරිම හිතවත්ව."

"ක්‍රිස්බරෝ පන්සලේ වැඩවසන මාළිගාතැන්න උපශාන්ත ස්වාමීන් වහන්සේ මතක් කරපු එක දෙයක් හරි වැදගත්." පින්සල පින්කමේ මතකයට ආයෙමත් ගියා.

"අපිට දකින්න ලැබෙන වෙනත් සමාජ සංවිධානවල අපි දකින්නේ එක වගේ පිරිසක්. සමහර විට එකම අධ්‍යාපන මට්ටමේ පිරිසක්. එහෙමත් නැත්නම් එකම වයසේ පිරිසක්. ඒත් ආනන්ද විද්‍යාලයේ ආදි ශිෂ්‍ය පිරිස දැක්කම ලොකු විවිධත්වයක් අපිට පේනවා. බාල - මහළු, උගත් නූගත්, හැම තරාතිරමකම අය හරිම සුහදත්වයෙන් වෙනසක් නැතිව කටයුතු කරන බව පේනවා."

"ඒකට එක හේතුවක් ඉස්කෝලෙට අවුරුදු 126 ක් විතර අතීතයක් තියෙන එක. අනික එදා මෙදා තුර හැමෝම සමානව සලකලා පවත්වාගෙන එන හැදියාව වෙන්න ඇති."

"ඉස්කෝලෙට හැතැප්ම දෙකක් ඇතුලත ඉන්න අයත් ඇතුල් කරගත්තානේ. මරදාන, පරණවාඩිය, මරියකඩේ, පංචිකාවත්ත, පුංචි බොරැල්ල වගේ පළාත්වල අයත් ඉස්කෝලෙ හිටියා. ඒ වගේ ම ගම්වලින් අපි වගේ අයත් හිටියා. දුප්පත් අයත් හිටියා, පෝසත් අයත් හිටියා. දක්ෂයොත් හිටියා. අදක්ෂයොත් හිටියා. හොඳ අයත් හිටියා. නරක අයත් හිටියා. ඒත් ඉස්කෝලෙ ඇතුලෙදි මේ හැමෝම එකයි. වෙනස් වෙනස් අය එක්ක එකට ඉගෙන ගන්නවා වගේම ක්‍රීඩා, සංගම් වාගේ බාහිර වැඩ කටයුතුත් කෙරෙනවා නේ. ඉතින් ඒ වටපිටාවේ ප්‍රතිපලය තමයි ස්වාමීන්වහන්සේට දැනෙන්න ඇත්තේ."

"බෙරික් පන්සලේ වැඩ සටහන දිගමඩුල්ලේ විමලානන්ද ස්වාමීන් වහන්සේ දේශනා කළා වගේ සර් හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා ලංකාවට ආවෙ පානදුරා වාදය ගැන ඉංග්‍රීසියෙන් ලියලා තිබුණ දේවල් කියවන්න ලැබිලා. බෞද්ධයින්ට ඒ දවස්වල වුණ අසාධාරණය දැනිලා. එතුමා මෙහෙ ඇවිත් බෞද්ධ පරම විඥානාර්ථ සමාගමට මූලිකත්වය දීලා බෞද්ධ පාඨශාලා ඇති කරවන්න පුරෝගාමී වුණා. එහෙම පිහිටවපු මුල්ම පාඨශාලාව තමයි ආනන්ද මහා විද්‍යාලය. මුළු රටටම අයිති ජාතික වස්තුවක්. අපට වුණත් ඒ ඉස්කෝලෙට යන්න ලැබුණේ ඒ හන්දානේ."

ඉස්කෝලෙට ඇතුලත් වුණ ළමයින්ට ලැබෙන දේවල් බොහෝමයි, අධ්‍යාපනය විතරක් ම නෙවෙයි. එදාටත් වැඩිය අද නැති බැරි අයට උදව්පදව් වෙන ආදි ශිෂ්‍ය සංගමයේ ශාඛා බොහෝමයි. ශිෂ්‍ය සංගම් එදාත් තිස් ගාණක් තිබුණානේ. ඉතින් මේ වාගේ ආයතනයක් දවසින් දවස දියුණු වෙන්න ඕන කියලා අපි ප්‍රාර්ථනා කරනවා. දිනපතාම විද්‍යාලයේ ශිෂ්‍යයින් ගායනා කරන පාසල් ගීතයෙන් කෙරෙන්නෙත් ඔය ප්‍රාර්ථනයමයි."

"දින දින කිතු ගොස බෝ වී
වැජඹෙනු අනඳ'ප මාතා...." ■


